# පාලි මූල ග්‍රන්ථ සංස්කරණය හා පරිවර්තනය මෑත කාලීන ශ්‍රී ලංකාවේ ථෙරවාද සම්ප්‍රදායය බලගැන්වීම කෙරෙහි උපස්තම්භක වී ඇති අයුරු

දිල්ශාන් මනෝජ් රාජපක්ෂ

It is to be emphasised here that the pivotal objective of compilation, translation and edition of Pâli texts was not only to enhance Theravâda tradition in its pristine purity in Sri Lanka but also to ensure its perpetual establishment making it immensely accessible to people in the world. The scrutiny of the history of Theravâda tradition in Sri Lanka exposes that the commentaries, sub-commentaries, annotations, glossaries and other related literature compiled on the Tripitaka - Sutta, Vinaya and Abhidhamma were immensely conducive to produce eminent lay and ordained scholars. After the documentation of the Tripitakain the 1st century in Sri Lanka, the recital of the Dhamma for its preservation continued and its oral tradition (Bhânakas) as Theravâda contributed to the establishment of the monastic education system spreading it throughout Sri Lanka. Thus, it is evident from the above factors that Theravâda tradition executed the process of translation and edition of Pâli texts from the inception.

---

© දිල්ශාන් මනෝජ් රාජපක්ෂ

සංස්. ජයමල් ද සිල්වා, දිල්ශාන් මනෝජ් රාජපක්ෂ, දුලන්කා ලංසකාර, දිනේෂ් සඳරුවන්

'ප්‍රභා' ශාස්ත්‍රීය සංග්‍රහය, තුන් වැනි කලාපය - 2013/2014

මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

## ප්‍රවේශය

ක්‍රි.පූ. තුන් වැනි සිය වස මධ්‍ය භාගයේ දී ලක් දිවට වැඩම කළ මිහිඳු මහරහතන් වහන්සේගේ අරමුණ වූයේ මෙරට බුදු දහම ස්ථාපිත කිරීම යි.[1] මේ ධර්ම දූත ආගමනය වනාහි භාරතයේ පැවැත්වූ තුන් වැනි ධර්ම සංගායනාව අවසානයේ භාරතයට සීමා වී පැවති බුදු දහම ජාත්‍යන්තරය වෙත ගෙන යමින් ථෙරවාදය ආරක්ෂා කිරීමෙහි ලා ක්‍රියා කළ මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේගේත්, ධර්මාශෝක මහ රජුගේත් උත්සාහවල ප්‍රතිඵලයකි.[2] පළමු වැනි, දෙ වැනි හා තෙ වැනි ධර්ම සංගායනාවල දී සංගෘහීත පාලි ත්‍රිපිටකය ලක් දිවට ගෙන එන ලද්දේ ද මිහිඳු හිමියන් විසින් ම යැ යි පැවැසේ.[3] මිහිඳු මහරහතන් වහන්සේගේ ආගමනයෙන් අනතුරු ව බෞද්ධ ථෙරවාද සම්ප්‍රදායයේ කේන්ද්‍රස්ථානය වූයේ ශ්‍රී ලංකාව යි. නිර්මල ථෙරවාදී බුදු සමයේ උරුමකරුවන් බවට පත් වීමෙන් පමණක් නොතිත් ලාංකීය ථෙරවාදීන් සිය බෞද්ධ සම්ප්‍රදායයේ අනාගත චිරස්ථිතිය උදෙසා බල ගැන්වීමෙහි ලා අප්‍රතිහත ධෛර්යයකින් කටයුතු කළ බවට සාධක රාශියක් ලාංකීය ශාසන ඉතිහාසයෙන් හමු වෙයි. සංගායනා පැවැත්වීම, කට පාඩමින් ත්‍රිපිටක ධර්මය පවත්වා ගෙන යෑම, ආරාමීය අධ්‍යාපනය ශක්තිමත් කිරීම, ශාසන සංශෝධන සිදු කිරීම, ශාසන විලෝපි දුර්මත බැහැර කිරීමට කටයුතු කිරීම මෙන් ම ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම හා ත්‍රිපිටකය පදනම් කරගෙන පුළුල් පරිවාර සාහිත්‍යයක් බිහි කිරීම ද ශ්‍රී ලංකාවේ ථෙරවාද සම්ප්‍රදායය බලගැන්වීමට ථෙරවාදීන් විසින් ක්‍රියාත්මක කරන ලද වැදැගත් ම කර්තව්‍ය කිහිපයකි.

ලංකාවේ ථෙරවාද සම්ප්‍රදායය බලගැන්වීම කෙරෙහි බලපෑ ඉහත කී කාර්ය අතරින් ථෙරවාදින් විසින් බිහි කරන ලද පාලි මූල ග්‍රන්ථ සාහිත්‍යය කොතෙක් උපස්තම්භක වූයේ ද යන්න ඒවායේ අඛණ්ඩ ප්‍රවර්තනය කෙරෙහි ථෙරවාදින්ගේ විශේෂ අවධානය යොමු වීමෙන් පැහැදිලි වේ. ඒ අනුව ථෙරවාදී සම්ප්‍රදායයේ එන පාලි මූල ග්‍රන්ථ සාහිත්‍යය ලක් දිව බුදු සසුන බලගැන්වීමට කොතෙක් දුරට උපස්තම්භක වන්නේ ද යන කරුණ ථෙරවාදින්ගේ සුවිශේෂ අවධානයක් ලබාගත් බවට සාක්ෂ්‍යය නම් අන් කවරක් නො ව මෑත කාලය දක්වා ම අවිච්ඡින්න ව එහි සංස්කරණ හා පරිවර්තන

ක්‍රියාදාමය සිදු වීම යි. මෑත කාලය දක්වා ශ්‍රී ලංකීය ථෙරවාදී සම්ප්‍රදායය බලගැන්වීමෙහි ලා පාලි මූල ග්‍රන්ථ සංස්කරණය කිරීමේ හා පරිවර්තනය කිරීමේ කාර්ය උපස්තම්භක වූ අයුරු සවිස්තරාත්මක ව විමසා බැලීම මේ ලිපියේ අරමුණ යි.

## ථෙරවාද මූල ග්‍රන්ථ සම්පාදනය හා සංවර්ධනය

ථෙරවාද මූල ග්‍රන්ථ යනුවෙන් මූලික වශයෙන් ම අදහස් කෙරෙනුයේ විනය, සූත්‍ර හා අභිධර්ම යන කොටස් තුනෙන් යුතු ත්‍රිපිටකය යි. එමෙන් ම ත්‍රිපිටකය පදනම් කරගෙන පසු කාලීන ව රචිත අටුවා, ටීකා, ටිප්පණී, ගැටපද හා වංසකථා යනාදි ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ ද මේ යටතේ දැක්විය හැකි ය. ථෙරවාද සම්ප්‍රදායයට අයත් මේ මූලග්‍රන්ථ සියල්ල ම රචනා වූයේ පාලි භාෂාවෙනි. පාලි භාෂාව බුද්ධ ධර්මය ව්‍යවහාර කිරීමට භාවිත භාෂා අතුරෙන් මුල් ම බස නො වේ නම්, ඉතා පැරණිතම බස ලෙස පිළිගැනේ.[4] යම් සම්ප්‍රදායයක, ආගමක හෝ දර්ශනයක අවිච්ඡින්න නොහොත් අඛණ්ඩ ප්‍රගමනයක් උදෙසා බලගැන්වීම අපේක්ෂා කරනුයේ නම්, එහි ලා කළ හැකි හෝ කළ යුතු කාර්ය අතරින් වැදැගත් ම හෝ මූලික ම කාර්යය වනුයේ ඒ සම්ප්‍රදායයට, ආගමට හෝ දර්ශනයට අදාළ මූලික ග්‍රන්ථවල චිර පැවැත්ම තහවුරු කිරීම යි. ඒ අනුව බෞද්ධ විග්‍රහය ද වනුයේ බුදුන් වහන්සේ දේශනා කර තිබෙන ධර්මය නො වසා, නො වළහා සියලු දෙනා වෙනුවෙන් විවෘත කළ යුතු බව යි.[5] පාලි මූල ග්‍රන්ථ සම්පාදන, පරිවර්තන හා සංස්කරණ ක්‍රියාදාමය ක්‍රියාත්මක වූයේ ථෙරවාදී බුදු දහම ලක් දිව බලගැන්වීමට පමණක් නො ව, එය සමස්ත ලෝක ප්‍රජාවට ද දායාද කරමින් එහි චිර පැවැත්ම තහවුරු කිරීමට බව විශේෂයෙන් ම මෙහි දී සඳහන් කළ යුතු කරුණකි.

මිහිඳු හිමියන් මෙරටට බුදු දහම වැඩම වන විට බුදුන් වහන්සේගේ භාෂිත ඇතුළත් භාරතීය සංගායනාවල දී මැනැවින් සංග්‍රහයට පත් ත්‍රිපිටකය ද ඊට භාරතයේ දී ම සම්පාදනය වූ අට්ඨකථා ද රැගෙන ආ බව සිතීම යුක්ති යුක්ත ය.[6] එලෙස ගෙන එන ලද ත්‍රිපිටකය සම්පූර්ණ වන්නේ ලක් දිව දී මහා විහාර වාසී තෙරවරුන්ගේ

දායකත්වයෙනි. මුඛ පරම්පරා නොහොත් භාණක පරම්පරා හරහා ත්‍රිපිටකය පවත්වා ගෙන යෑමේ දුෂ්කර, භාරදූර වගකීම ද මහා විහාර භික්ෂූන් සතු වූ අතර, ඔවුන්ගේ පරිශ්‍රමය නො තිබෙන්නට ථෙරවාද මූල ග්‍රන්ථ නාම මාත්‍රික ව හෝ සොයාගැනීමට අපහසු වනු ඇත. කෙසේ වෙතත් බෞද්ධ විරෝධී ද්‍රවිඩයන් ලක් දිව ආක්‍රමණය කොට රාජ්‍ය පාලනය පැහැරගැනීම, බැමිණිටියා සාය හා ඉන් ලත් අත්දැකීම්, අවිනයවාදීන්, අධර්මවාදීන් ශාසනයට ඇතුළත් වීම, මහාවිහාරයට විරුද්ධ වූත්, රජුගේ අනුග්‍රහය ලැබුවා වූත් අලුත් නිකායක් (අභයගිරිය) පහළ වීම[7] යනාදි කරුණු ද විදර්ශනා ධුරයට වඩා ග්‍රන්ථ ධුරය කෙරෙහි භික්ෂූන්ගේ ආකර්ෂණය[8] වැනි කරුණු ද නිසා බෞද්ධ මූල ග්‍රන්ථ සංරක්ෂණය හා පෝෂණය සඳහා ගත හැකි ශක්තිමත් ම පියවර ලෙස ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරිම කෙරෙහි මහා විහාර භික්ෂූන්ගේ අවධානය යොමු විය. ඒ අනුව බුද්ධ පරිනිර්වාණයෙන් වසර හාර සීය හතළිහක් (440) ගත වූ පසු වළගම්බා රජ දවස ප්‍රදේශීය පාලකයකුගේ අනුග්‍රහය ඇති ව මාතලේ ආලෝක විහාරයේ දී ත්‍රිපිටක පුස්තකාරූඪ සංගායනාව සිදු වන්නේ, බෞද්ධ මූල ග්‍රන්ථ ආරක්ෂා කිරීමෙහි ලා ගත යුතු වැදගත් ම කාර්යය ඉටු කරමිනි. මෙලෙස තල්පත්වල ලියැවුණු ත්‍රිපිටකය රට පුරා විහාරස්ථානවල ව්‍යාප්ත වූ අතර අම්බලන්ගොඩ මහාවිහාර තාලපණ්ණ පුස්තක පිටපත්, හික්කඩුවේ ජනනන්දරාම මහාවිහාරයේ තාලපණ්ණ පිටපත්, තොටගමුව රජමහාවිහාරයෙහි තාලපණ්ණ පුස්තක පිටපත්, මහනුවර පත්තිරිප්පු පුස්තකාලයේ තාලපණ්ණක පුස්තක පිටපත්, පොල්වත්තේ අග්ගාරාම මහාවිහාරයෙහි තාලපණ්ණ පුස්තක පිටපත්, වේරගොඩ ක්ෂේත්‍රාරාම මහාවිහාරයෙහි තාලපණ්ණ පුස්තක පිටපත්[9] මෙයට නිදසුන් ය. ඇතැම් විට කාලයෙන් කාලයට යම් යම් සංස්කරණවලට ද භාජන වූවා විය හැකි බව මෑත කාලීන ව බුද්ධ ජයන්ති ත්‍රිපිටක සංස්කරණ ක්‍රියාවලියේ දී එබඳු තල්පත්වල රචිත ත්‍රිපිටක පිටපත් එකිනෙක හා සංසන්දනය කිරිමට සිදු වීමෙන් පැහැදිලි වේ.[10]

ත්‍රිපිටකය ලේඛනාරූඪ කරන ලද්දේ ක්‍රි.පූ. පළමු වැනි ශත වර්ෂයෙහි තරම් කලෙක වුව ද ක්‍රි.පූ. තෙ වැනි ශත වර්ෂයේ දී බුදු දහම මෙහි පැමිණ වැඩි කලක් යෑමට මත්තෙන් හෙළ අටුවා වෙන වෙන ම පොත් වශයෙන් පරිහරණය වූ බව පෙනේ.[11] එතෙක්

පැවැති හෙළටුවා සංස්කරණය කරමින් සිදු වූ පාලි අට්ඨකථාකරණයට බුද්ධඝෝෂ හිමි විශාල දායකත්වයක් සැපැයූ අතර බුද්ධදත්ත, මහානාම උපසේන, ධම්මපාල යනාදි හිමිවරු ද මෙහි ලා වැදැගත් වෙති. අට්ඨකථාකරණය අවසන් වීමටත් පෙරාතු ව ගැටපද හා ටීකා ග්‍රන්ථ සම්පාදනයට ද මහාවිහාර වාසී භික්ෂූන් උත්සුක වූයේ ථෙරවාද සම්ප්‍රදායය බලගන්වමින් තවදුරටත් මූල ග්‍රන්ථ පිළිබඳ පරිචය ඉහළ දැමීමේ අරමුණෙන් විය යුතු ය. ඒ අනුව ත්‍රිපිටකය උදෙසා ටීකා සම්පාදනය ක්‍රි.ව. පස් වැනි සිය වසේ දී ම ආරම්භ වී ඇති අතර පොලොන්නරු සමයේ දී ටීකාකරණය උපරිමයට පත් වූ බව පෙනේ.[12] පැරැන්නන්ගේ අර්ථ වර්ණනා ක්‍රම, සිංහලයේ නිවැරැදි ගත් වහර, සාහිත්‍ය ග්‍රන්ථ හෝ ග්‍රන්ථකරුවන්ගේ හෝ කාලය නිර්ණය කිරිමට හේතු වන යටගිය විත්ති, සමාජ, ආර්ථික, සාමයික හා සාහිත්‍යයික යනාදි කරුණුවලින් සාහිත්‍යමය වශයෙන් පෝෂණය වූ[13] සන්න, ගැටපද, ටිප්පණි ආදි පෙළ උදෙසා රචිත එහෙත් පෙළ තරම් වටිනා සාහිත්‍ය නිර්මාණ ථෙරවාදී මූල ග්‍රන්ථ පදනම ශක්තිමත් කරනු වස් ලංකීය භික්ෂූන්ගෙන් ලද වටිනා දායාද ලෙස සඳහන් කළ හැකි ය.

සූත්‍ර, විනය හා අභිධම්ම යන ත්‍රිපිටක ග්‍රන්ථ හා ත්‍රිපිටකය උදෙසා ලක් දිව රචිත අටුවා, ටීකා, ටිප්පණි, ගැටපද, සන්න හා වංස ආදිය ථෙරවාදය සම්බන්ධයෙන් ප්‍රවීණ ගිහි පැවිදි, උගත්, බහුශ්‍රැත පඬිවරුන් බිහි කිරිම උදෙසා ප්‍රබල දායකත්වයක් සැපැයූ බව ලංකීය ථෙරවාද සම්ප්‍රදායයෙහි ඉතිහාසය පිරික්සීමෙන් පැහැදිලි වේ. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ වීමෙන් පසු එය වනපොත් කිරීමේ කාර්යය අභාවයට නො ගිය[14] අතර ධර්මය මතකයෙන් පවත්වා ගෙන යෑමේ කටයුතු නිසා ඇති වූ ආරාමීය අධ්‍යාපන ක්‍රමවේදය තව දුරටත් ශක්තිමත් ව ලක් දිව පුරා ජාලගත කිරිමට ද දායක විය. එබැවින් පාලි මූල ග්‍රන්ථ අනාගතය සඳහා සංස්කරණය කිරීමේ හා පරිවර්තනය කිරීමේ ක්‍රියාදාමයක අවශ්‍යතාව ථෙරවාද සම්ප්‍රදායය මුල සිට ම අපේක්ෂා කළ කරුණක් බව පෙනේ. පාලි මූල ග්‍රන්ථවල පළමු පිටපත් දැනට සොයාගැනීමට නොමැති වුව ද ඒවායේ සංස්කරණයට භාජන වූ පුස්කොළ පොත් අදටත් හමු වන්නේ ඒ කරුණ තව දුරටත් ස්ඵුට කරමිනි. දැනට ලංකාවේ පුස්කොළ පොත්

අතරින් පැරණි ම යැ යි සැලැකෙන, කොළඹ කෞතුකාගාරයේ තැන් පත් කොට ඇති, විනය පිටකයට අයත් චුල්ලවග්ගපාළියේ අත්පිටපත ක්‍රි.ව. 13 වැනි සිය වසට අයත් ය.[15] ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය සතු ව ඇති මහාවග්ගයෙහි පුස්කොළ අත්පිටපත ද ලංකා විශ්වවිද්‍යාලයයේ පුස්තකාලයයෙහි ඇති විසුද්ධිමග්ග ටීකා අත්පිටපත ද ක්‍රි. ව. 13 වැනි සිය වසට අයත් බව සැලැකේ.[16] කොළඹ කෞතුකාගාර පුස්තකාලයයෙහි ඇති සංයුත්තනිකාය අත්පිටපතෙහි එන අවසාන පාඨය අනුව එය පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙනේ විසූ මංගල නම් භික්ෂූන් වහන්සේ නමක් විසින් ක්‍රි.ව. 1412 දී පිටපත් කර ඇත.[17] කෞතුකාගාර පුස්තකාලයයෙහි ඇති ක්‍රි.ව. 1521 දී පිටපත් කරන ලද පාඨ පරමත්ථප්පකාසිනී නැමැති ග්‍රන්ථය ධම්මසංගණි ටීකාවෙහි පිටපතකි.[18] මෙබඳු පාලි මූල ග්‍රන්ථ පිටපත් විශාල සංඛ්‍යාවක් ලක් දිව පුරා ව්‍යාප්ත පොත්ගුල් විහාරවල තැන් පත් කර ඇත. මෙලෙස පාලි මූල ග්‍රන්ථ පිටපත් ලක් දිව පුරා විහිදී පැවැති හෙයින් මහනුවර යුගයේ දී පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ආක්‍රමණවල දී පවා ථෙරවාද බුදු දහම නො නැසී පැවැතුණි. මේ තත්ත්වය අවබෝධ කරගත් මෑත කාලීන ථෙරවාද සාම්ප්‍රදායයිකයන් පාලි මූල ග්‍රන්ථ සංස්කරණ හා පරිවර්තන කටයුතු ඉදිරියට ගෙන යමින් ශ්‍රී ලංකාවේ ථෙරවාද සම්ප්‍රදායය බලගැන්වීමට කටයුතු කළ අතර එබඳු අවස්ථා පහත සඳහන් පරිදි සාරාංශ කර දැක්විය හැකි ය.

1. පසුගිය ශත වර්ෂය ආරම්භයේ දී හේවාවිතාරණ භාරය පාලි අටුවා, ත්‍රිපිටකය ආදි මූල ග්‍රන්ථ සංස්කරණය කිරීම.
2. බුද්ධ ජයන්තිය නිමිත්තෙන් පාලි ත්‍රිපිටකය සංස්කරණය කොට පරිවර්තනය කිරීම.
3. ඒ.පී. ද සොයිසා මහතාගේ ත්‍රිපිටක පරිවර්තනය.
4. ත්‍රිපිටකය සරල සිංහලයට පරිවර්තනය කිරීම.(1980 දශකයේ සිට)
5. පාලි අටුවා සිංහලයට පරිවර්තනය කිරීම. (1990 දශකයේ සිට)

පාලි මූල ග්‍රන්ථ සංස්කරණ හා පරිවර්තන ක්‍රියාදාමවල කැපී පෙනෙන දියුණුවක් පසු ගිය සියවසේ ලැබූ අතර මුද්‍රණ කටයුතු සම්බන්ධයෙන් තාක්ෂණ කටයුතුවල සිදු වූ ශීඝ්‍ර දියුණුව යටත් විජිත කාලයේ දී ම ලක් දිවට ද පැමිණීම මෙයට බලපෑ ප්‍රබල හේතුවකි.

ඒ අනුව මෙතැන් සිට අපගේ මූලික අවධානය යොමු වන්නේ ඉහතින් දැක්වූ ආකාරයට 19 වැනි සිය වසේ සිට වර්තමානය දක්වා පාලි මූල ග්‍රන්ථ සංස්කරණ හා පරිවර්තන කටයුතු ලංකීය ථෙරවාද සම්ප්‍රදායය බලගැන්වීමට ඉවහල් වූ අයුරු සාකච්ඡා කිරීමට ය.

## 01. පසු ගිය ශත වර්ෂය ආරම්භයේ දී හේවාවිතාරණ භාරය පාලි අටුවාව, ත්‍රිපිටකය ආදි මූල ග්‍රන්ථ සංස්කරණය කිරීම

විවිධ දුෂ්කරතාවලට මුහුණපාමින් ශත වර්ෂ ගණනාවක් ආරාමවල පොත්ගුල්වල සුරක්ෂිත ව තබා තිබූ පුස්කොළ පොත්වල ලිඛිත ත්‍රිපිටකය ඇතුළු මූල ග්‍රන්ථ ගෞරවයෙන් පරිහරණය කිරීමේ සිරිත සම්ප්‍රදායානුකූල ව පවත්වාගෙන යෑමේ වගකීම මහතෙරවරු සතු විය. අනගාරික ධර්මපාලතුමාගේ ජාතික, ආගමික වැඩපිළිවෙළ ආරම්භ වීමෙන් පසු ව ලක් දිව ථෙරවාද සම්ප්‍රදායය බලගැන්වීමෙහි ලා කළ යුතු මූලික කටයුත්තක් ලෙස පාලි මූල ග්‍රන්ථ සංස්කරණය හා පරිවර්තනය කර ලක් දිව පුරා ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාව තවදුරටත් මතු වන්නට විය. ඒ අනුව ධර්මපාලතුමාගේ ජාතික හා ශාසනික ක්‍රියාවලියට සහාය වනු පිණිස එතුමාගේ ඥාතීන් පාලි මූල ග්‍රන්ථ සංස්කරණ හා පරිවර්තන කාර්යයට දායක වූ බව පෙනේ.[19]

මේ කාර්යය ශාසන ඉතිහාසයෙහි ධර්ම සංගායනාවලින් පසු පුළුල් ස්ථිර පදනමක් යටතේ බුදු දහම පිළිබඳ මෙබඳු කටයුත්තක් ඇරැඹූ මෑත කාලීන මුල් ම පියවර යි. 1913 දී ලංකා ආණ්ඩුකාරවරයා ලෙස පැමිණෙන ශ්‍රීමත් රොබට් චාමර්ස් ලක් දිව පාලි මූල ග්‍රන්ථ මුද්‍රණය කර බෙදා හැරීම සඳහා අලුවිහාර සංස්කරණය නමින් ක්‍රියාත්මක කරන වැඩ සටහන 1915 දී ඇති වූ ගැටුම් කලබල නිසා අත්හිටුවන විට ප්‍රකාශයට පත් කළ හැකි වී තිබුණේ පපංචසූදනී නම් වූ මජ්ඣිමනිකායට්ඨකථාව පමණි.[20] එහෙත් ඒ ශාසනික කර්තව්‍යය වෙනුවෙන් අවධානය යොමු කළ සයිමන් ඇලෙක්සැන්ඩර් හේවාවිතාරණ මහතා ත්‍රිපිටකයට අයත් ග්‍රන්ථ සියල්ල මුද්‍රණය කිරීමේ අරමුණින් හාවඩ් විශ්වවිද්‍යාලයයේ මහාචාර්ය ලැන්මන් මහතාගේ උපදෙස් පරිදි පළමුවෙන් අට්ඨකථා සංස්කරණය කර ප්‍රකාශයට පත් කිරීමට කටයුතු යොදා ඇත.[21]

ඒ අනුව 1911 දී සංයුත්තනිකායේ අටුවාව ප්‍රකාශයට පත් විය. හේවාවිතාරණ මහතා අභාවප්‍රාප්ත විට මේ ග්‍රන්ථය පාලි අට්ඨකථා කාණ්ඩගත ග්‍රන්ථයක් ලෙස සකස් වෙමින් පැවැතිණ.[22] ඒ අනුව 1913 දී අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, රත්මලානේ ශ්‍රී ධම්මානන්ද හිමි හා ධර්මාලෝක හිමි බඳු ධර්මධර භික්ෂූන් විසි පස් නමක් ද අනගාරික ධර්මපාලතුමා ද සහභාගී වී පිහිටුවන ත්‍රිපිටක මුද්‍රණ සභාවෙන් පාලි මූල ග්‍රන්ථ සංස්කරණ කටයුතු අඛණ්ඩ ව පවත්වා ගෙන යෑමට තීරණය විය.[23] ඒ අනුව 1917 දී අට්ඨකථා කාණ්ඩයේ පළමු වැනි ග්‍රන්ථය ලෙස පේතවත්ථු අට්ඨකථාව මුද්‍රණය විය. 1977 වන විට හේවාවිතාරණ භාරය අටුවා ග්‍රන්ථ කාණ්ඩ වශයෙන් හතළිස් නවයක් (49) පමණ ද ත්‍රිපිටක පොත් කාණ්ඩ වශයෙන් විසි හතරක් (24) පමණ ද ප්‍රකාශයට පත් කළ[24] අතර 2002 වසර වන විට අභිධර්ම පිටකයට අයත් සියලු ග්‍රන්ථ ද ප්‍රකාශයට පත් කිරීමට සමත් විය.[25]

මේ මූල ග්‍රන්ථ සංස්කරණ කටයුතු බහුශ්‍රැත භික්ෂූන්ගේ උපදේශකත්වයෙන් සිදු වීම මේ මුද්‍රණය හැම පිරිසකගේ ම ඇගැයුමට ලක් වීමට හේතුවක් විය. ටීකා ග්‍රන්ථ මුද්‍රණය පිළිබඳ යම් යම් විද්වතුන්ගේ අවධානය යොමු වුව ද, ඒ සඳහා ගත් උත්සාහ සාර්ථක නො විණ. සෝමාවති හේවාවිතාරණ ටීකා ග්‍රන්ථ මාලාවෙන් ඒ ඌනතාව සැපිරුණු අතර රේරුකානේ චන්දවිමල හිමිගේ මෙහෙයවීමෙන් හේනේගම කල්‍යාණ හා සිරි හේන්ගොඩ කල්‍යාණධම්ම යන හිමිවරුන් සකස් කළ දීඝනිකාය ටීකාව 1967 දී ප්‍රකාශයට පත් වන්නේ මෙහි ප්‍රතිඵලයක් ලෙස ය.[26] එසේ ම රේරුකානේ චන්දවිමල හිමි රචනා එයින් කරන ලද පට්ඨානප්පකරණ සන්නය ද්විතීයික සංස්කරණයක් ලෙස ප්‍රකාශ කරන්නේ ද හේවාවිතාරණ භාරය මඟිනි.[27]

## 02. 2500 වැනි බුද්ධ ජයන්තිය නිමිත්තෙන් පාලි ත්‍රිපිටකය සංස්කරණය කොට පරිවර්තනය කිරීම

1956 වර්ෂය වන විට බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් වසර දෙ දහස් පන් සියයක් සම්පූර්ණ වීම නිමිති කරගෙන ආගමික අභිවෘද්ධියත්, ජාතික ප්‍රබෝධයත් උදෙසා ත්‍රිපිටකය සිංහල භාෂාවට

නඟා පෙළත් සමඟ මුද්‍රණය කර බෞද්ධ ජනයා අතට පත් කළ යුතු ය, යන අදහස ශාසනයට ළැදි පිරිස් එවක රජයට ඉදිරි පත් කළ හ.[28] මේ සම්බන්ධයෙන් පමණක් නො ව බුද්ධ ජයන්ති උත්සවය හා වෙනත් කටයුතු සම්බන්ධයෙන් ද සොයා බැලීම සඳහා එවකට ලංකා ආණ්ඩුවේ අග්‍රාමාත්‍ය ජෝන් කොතලාවල මහතා විසින් අනුකාරක සභාවක් ද පත් කරනු ලැබූ[29] අතර එමඟින් සාකච්ඡා කර සම්පාදිත වාර්තාව අනුව බුද්ධ ජයන්ති කාර්ය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ලංකා බෞද්ධ මණ්ඩලය ද ස්ථාපිත විය.[30] ත්‍රිපිටකය කොටස් වශයෙන් බෙදා සිංහල භාෂාවට නැඟීම සඳහා ත්‍රිපිටක පරිවර්තනය පිළිබඳ කාරක සභාවක්[31] ද පරිවර්තනය කරන ග්‍රන්ථ සංශෝධනය කර මුද්‍රණය කිරීම සඳහා සංස්කාරක මණ්ඩලයක් ද පත් කරන ලදි.[32] ඒ අනුව දශක තුනකටත් වඩා අධික කාලයක් පුරා මහත් පරිශ්‍රමයක් දරමින් සිදු කෙරුණු මේ ත්‍රිපිටක ග්‍රන්ථ පරිවර්තන හා සංස්කරණ ක්‍රියාදාමය සාර්ථක කර ගත්තේ එතෙක් බලයට පත් හැම රජයක ම සහායෙනි.[33] ඒ අනුව ලංකා බෞද්ධ මණ්ඩලය ක්‍රියාත්මක කළ ත්‍රිපිටක පරිවර්තනය හා සංස්කරණ කටයුතු ත්‍රිපිටකයට අයත් සියලු ග්‍රන්ථ මුද්‍රණය කර ප්‍රකාශනය කිරීමෙන් අනතුරු ව අවසන් විය. මෙමඟින් සිංහල භාෂාවෙන් සම්පූර්ණ ත්‍රිපිටකය කියැවීමට බෞද්ධ පාඨකයාට අවස්ථාව උදා වූ අතර නිර්මල ථෙරවාදී බුදු දහම පිළිබඳ ප්‍රාමාණික විද්වතුන් බිහි වීමට ද මේ කර්තව්‍යය උපස්තම්භක විය.

කෙසේ නමුත් ශ්‍රී ලංකා රජයේ අනුග්‍රහයෙන් ප්‍රකාශයට පත් වූ බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේ පිටපත් ස්වල්පයක් පමණක් මුද්‍රණය වූ බැවින් ද නැවත වරක් මුද්‍රණය කිරීමට රජයේ අවධානය යොමු නො වූ බැවින් ද නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමේ වගකීම බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය අයත් කරගත්තේ ය.[34] තායිවානයේ සමූහ බෞද්ධ අධ්‍යාපන පදනමේ ආධාර ඇති ව බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා නැවත වරක් මුද්‍රණය වනුයේ මෑත කාලීන බොහෝමයක් වෙහෙර විහාරස්ථාන හා පිරිවෙන් ආදි බෞද්ධ ආයතනවලට ත්‍රිපිටක ග්‍රන්ථ බෙදා හැරීමේ අරමුණෙනි.[35] මේ මුද්‍රණ දෙක ම සංස්කරණ නො ව පුනර්මුද්‍රණ පමණක් බව මෙහි ලා කිව යුතු ය.

## 03. ඒ.පී. ද සොයිසා මහතාගේ ත්‍රිපිටක පරිවර්තනය

පාලි මූල ග්‍රන්ථ සරල සිංහල භාෂාවෙන් රචනා කර හුදී ජන ධර්මාවබෝධය පිණිස ඉදිරි පත් කිරීමට ප්‍රයත්න දැරීම සම්බන්ධයෙන් දිගු ඉතිහාසයක් පවතින බව බු.ව. 882 දී බුද්ධදාස රජ කාලයේ දී මහාධර්මකථික නම් ස්ථවිරයන් වහන්සේ නමක් සූත්‍ර ධර්ම සරල සිංහලයෙන් රචනා කළ බවට හමු වන තොරතුරුවලින් විද්‍යමාන වේ.[36] ත්‍රිපිටකය ඇතුළු මූලික ධර්ම ග්‍රන්ථ සරල සිංහලයෙන් රචනා වී තිබීම කාලීන අවශ්‍යතාවක් සේ දකින පාලි භාෂාව හා සාහිත්‍යය පිළිබඳ පෘථුල දැනුමක් ඇති ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා[37] ධර්මය විනය පිළිබඳ බහුශ්‍රැත අනුශාසක මණ්ඩලයක්[38] යටතේ ත්‍රිපිටකය සරල සිංහලයට පරිවර්තනය කිරීමට යොමු වන්නේ 1950 දශකයේ දී ය. සොයිසා මහතාගේ අනුග්‍රාහකත්වයෙන් පරිවර්තනය හා සංස්කරණය කොට ප්‍රකාශයට පත් කරන ත්‍රිපිටකය තරම් සම කාලීන සරල සිංහලයෙන් ලියැවුණු වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහි ව නැති තරම් ය.[39] එමෙන් ම සරල සිංහලෙන් රචිත මේ මූල ග්‍රන්ථ පරිශීලනය කිරීමට පහසු වූ නිසා මේ පිටපත් බොහෝ ජනප්‍රිය වූ අතර එමඟින් සම කාලීන ව ථෙරවාද සම්ප්‍රදායය වටා සිටින විශාල පිරිසකගේ ධර්ම පිපාසාව සංසිඳවීමට ද හැකි විය.

ත්‍රිපිටකය සරල සිංහල බසට නැඟීමෙන් අනතුරු ව සොයිසා මහතා අටුවා ග්‍රන්ථ ද සරල සිංහල බසට නැඟීම නිසා අටුවාවල අන්තර්ගත ගැඹුරු ධර්ම කරුණු පැහැදිලි කරගැනීමට, යම් යම් පදවල නොයෙක් තේරුම් අවබෝධ කරගැනීමට, ඉතිහාසගත කරුණු අවබෝධ කරගැනීමට හා ව්‍යාකරණ යෙදුම් වටහාගැනීමට බොහෝ දෙනාට හැකි විය.[40] ත්‍රිපිටකයත් ත්‍රිපිටකය උදෙසා කළ විසුද්ධි මාර්ගයත්, අටුවාත් ඉතා කෙටි කාලයක දී බෞද්ධ පාඨකයා අතට පත් කිරීමට සොයිසා මහතාට හැකි විය.[41] මේ පරිවර්තනය ඉතා සරල හා සංක්ෂිප්ත වීම නිසා එක් අතකින් පහසුවක් සැලැසුණා මෙන් ම සූත්‍රයක පූර්ණ අර්ථය තේරුම්ගැනීමට යම් තරමක අපහසුවක් වූ බව ද කිව යුතු ය. කෙසේ වෙතත් මේ සරල සිංහල

මූල ග්‍රන්ථවලට ඇති යහපත් ප්‍රතිචාරය සැලැකිල්ලට ගෙන සොයිසා මහතාගේ පරිවර්තන 2012 වර්ෂයේ සිට ඇස්. ගොඩගේ සහ සහෝදරයන් විසින් නැවත ප්‍රකාශනය කරනු ලැබේ.

## 04. ත්‍රිපිටකය සරල සිංහලයට පරිවර්තනය කිරීම (1980 දශකය)

බුදු දහම පිළිබඳ පොත්පත් කියැවීමටත්, දහම් මග වටහාගැනීමටත් උනන්දුවක් දක්වන නව බෞද්ධ ප්‍රබෝධයක් ලොව පුරා පැතිර යමින් පවතින 1980-1990 වකවානුව වන විට බෞද්ධ මූල ග්‍රන්ථ පරිශීලනය කිරීමට බොහෝ ලාංකීය පිරිස් යොමු වීම විශේෂ කරුණකි. එහෙත් මේ වන විට ආචාර්ය ඒ.පී. ද සොයිසා මහතා පරිවර්තනය කළ සරල සිංහල ත්‍රිපිටක ප්‍රකාශනය ද රජය මුද්‍රණය කළ බුද්ධ ජයන්ති පාලි සිංහල ත්‍රිපිටකය ද සොයාගැනීම පවා දුෂ්කර විය.

මේ අවශ්‍යතාව සැලකිල්ලට ගත් බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය සියලු දෙනාට තේරුම්ගත හැකි වන පරිදි සරල හා සංක්ෂිප්ත ලෙස පාලි ත්‍රිපිටකය පරිවර්තනය හා සංස්කරණය කොට මුද්‍රණය කිරීමට යොමු විය. ඒ අනුව සූත්‍ර පිටකය සරල හා සංක්ෂිප්ත ලෙස සකස් කර මුද්‍රණය කිරීමට ධර්ම පර්යේෂණ ඒකකයක් පිහිටුවා මේ කටයුතු සිදු කිරිමට උපදේශක මණ්ඩලයක්[42] ද පරිවර්තක මණ්ඩලයක්[43] ද පත් කරන ලදි.

සාමාන්‍ය ජනතාවට ද අවබෝධ කරගත හැකි ව්‍යවහාරික භාෂාවෙන් බුදුන් වහන්සේ දේශනා කළ ධර්මය සරල ව ජනතාව අතට පත් කර ඔවුන්ගේ ධර්ම ඥානය වර්ධනය කිරිමේ අරමුණින් කිරිබත්ගොඩ ඥානානන්ද හිමි ද සංස්කරණය හා පරිවර්තන ක්‍රියාදාමයක් ආරම්භ කර තිබේ. මේ සඳහා ඇරඹූ බෝධි ඥාන සභාවේ මහමෙව්නාවේ බෝධි ඥාන ත්‍රිපිටක පරිවර්තන අරමුදල නමින් අරමුදලක් පිහිටුවා එමගින් සූත්‍ර පිටකය සරල බසින් රචනා වීම අදටත් අඛණ්ඩ ව සිදු කරමින් පවතී.[44] මෙය ද කාලීන අවශ්‍යතාවක් පිරිමසාලීමකි. එහෙත් මේ පරිවර්තනය සම්බන්ධයෙන් ද සුභවාදී මෙන් ම අසුභවාදී මත නැතුවා නො වේ.

## 05. පාලි අටුවා සිංහලයට පරිවර්තනය කිරීම (1990 දශකය)

1845 දී ආරම්භ වූ ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ පාලි අට්ඨකථා සිංහලයට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතියෙන් ලක් දිව සරල සිංහල භාෂාවෙන් අටුවා ග්‍රන්ථ පරිවර්තනය හා සංස්කරණය වී ප්‍රකාශයට පත් විය. මේ සඳහා ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය පාලි අට්ඨකථා පරිවර්තන ව්‍යාපෘතියක් පිහිටවූවේ ය. එහි සභාපතීත්වය හෙබවූයේ ඇම්.බී. ආරියපාල මහතා ය.[45] සිංහල භාෂාවෙන් පාලියට නැඟූ අටුවා ශත වර්ෂ දහ සයක් පමණ ගත වූ පසු නැවත සිංහලයට පෙරළීමේ අවශ්‍යතාව ක්‍රමයෙන් මතු විය. ක්‍රි.ව. 5 වැනි සිය වසේ දී හෙළටුවා පාලියට පෙරළන්නට වූයේ සිංහල නො දත් පාලි දත් දීපාන්තරවාසීන්ගේ පවා ප්‍රයෝජනය සැලකිල්ලට ගනිමිනි. මෙකල ඒ අටුවා නැවත සිංහලයට පෙරළීමේ අවශ්‍යතාව මතු වී ඇත්තේ පාලි නො දත් සිංහල බෞද්ධ ජනතාවගේ ප්‍රයෝජනය උදෙසා ය. පාලි ත්‍රිපිටකය මෙන් ම අටුවා ද සිංහලයට පෙරළීම කාලෝචිත ක්‍රියාවක් වුව ද එය ක්‍රියාත්මක කිරීම එතරම් පහසු කාර්යයක් නොවන්නට ඇත. විශේෂයෙන් ම සාම්ප්‍රදායික අටුවා ක්‍රමවේදයේ පැවැති අර්ථකථා, නිරුක්ති ආදිය නිවැරැදි ව හෙළයට නැඟීම සඳහා භාෂා නිපුණත්වය හා පරිවර්තන කුසලතාව නිතැතින් ම අවශ්‍ය වූවකි.

මේ අනුව ආචාර්ය ඒ.පී. ද සොයිසා මහතාගෙන් පසු ව අටුවා සරල සිංහලයට පරිවර්තනය හා සංස්කරණය කිරීමේ බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර්මුද්‍රණ කාර්යයට බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිරි පත් වූවේ ය. අටුවා සිංහලයට පරිවර්තනය හා සංස්කරණය කර මුද්‍රණය කිරිමට අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කළ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය අට්ඨකථා පරිවර්තක මණ්ඩලයක්[46] ද පරිවර්තනය කරන අට්ඨකථා සංස්කරණය කිරීම සඳහා අට්ඨකථා පරිවර්තක සමීක්ෂණ මණ්ඩලයක් ද[47] පත් කිරීමෙන් අනතුරු ව ඉතා ටික කාලයක දී ත්‍රිපිටකය උදෙසා රචිත සියලු පාලි අටුවා පරිවර්තනය කර මුද්‍රණය කර ප්‍රකාශයට පත් කළේ ය. මෑත භාගය වන විට ටීකා, සන්න, ගැටපද ආදි බෞද්ධ මූල ග්‍රන්ථවල ද පරිවර්තන හා සංස්කරණ කටයුතු සිදු කරමින් මුද්‍රණය කිරීම බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිරි පත් වී ඇත්තේ දුර්ලභ බෞද්ධ මූල ග්‍රන්ථ බෞද්ධ පාඨකයා

අතට පත් කරමින් ඔවුන්ගේ ධර්ම ඥානය වර්ධනය කර ථෙරවාද සම්ප්‍රදායය බලගැන්වීමෙහි ලා විශාල කාර්යයක් සිදු කරමිනි.

බෞද්ධ මූල ග්‍රන්ථ සංස්කරණය හා පරිවර්තනය කිරීමේ ඉහත කී ප්‍රධාන අවස්ථා හැරුණු විට තව තවත් මුද්‍රණ ක්‍රියාදාම ප්‍රකට ව හෝ අප්‍රකට ව සිදු වී තිබේ. ශ්‍රී සම්බුද්ධ ධර්මයේ චිරස්තිථිය හා උද්දීපනය අපේක්ෂාවෙන් 1946 දී ධර්මධර භික්ෂූන් වහන්සේලාගේ මූලිකත්වයෙන් පිහිටුවන ලද බෞද්ධ සාහිත්‍ය සංගමයෙන් පාලි ත්‍රිපිටකයත්, ඒ සමඟ තදනුබද්ධ ග්‍රන්ථත් දේශදෙශාන්තරයෙහි ව්‍යාප්ත කිරීමට මූලිකත්වය ලබාදෙන්නට වූයේ හුදී ජනයාගේ ධර්ම පිපාසාව නම් කාලීන අවශ්‍යතාව ද සැලැකිල්ලට ගනිමිනි. හේවාවිතාරණ භාරයෙන් අටුවා ප්‍රකාශනය වෙමින් පැවැතිය ද ත්‍රිපිටක මුද්‍රණයක් මේ වන විට ලක් දිව සිදු නො වී පැවැතීම සැලකිල්ලට ගෙන බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ මාලාව නමින් ත්‍රිපිටකය මුද්‍රණය කර ප්‍රකාශනය කිරීම මේ යටතේ සිදු වූ අතර ඒ ක්‍රියාදාමය 1948 දී අංගුත්තරනිකාය මුද්‍රණය කර ප්‍රකාශනය කිරීමත් සමඟ ආරම්භ කෙරිණ.[48] 2500 වන ශ්‍රී බුද්ධ ජයන්තිය නිමිත්තෙන් ශ්‍රී ලංකා රජය ත්‍රිපිටක මුද්‍රණ කාර්යයට එළැඹීමටත් මත්තෙන් කිරිඇල්ලේ ඤාණවිමල හිමි පුරෝගාමී මෙහෙවරක නියැළී ශ්‍රී පාද ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නමින් ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවක් මුද්‍රණය කළේ ය.[49] එමඟින් මුද්‍රණය කළ අභිධර්ම පිටකයට අයත් ග්‍රන්ථ හේවාවිතාරණ භාරයෙන් නූතනයේ පුනර්මුද්‍රණය කර තිබේ.[50] සිරිදේවමිත්ත හා රේවත හිමිවරුන් ද ත්‍රිපිටකය පිළිබඳ සංස්කරණයක් සිදු කර ඇත්තේ 19 වැනි සිය වසේ මුල් භාගයේ දී ය. සෝමාලෝක තිස්ස හිමි ද ත්‍රිපිටකය උදෙසා සිදු කළ සෝමාලෝක තිස්ස සංස්කරණය ද බද්දේගම ශ්‍රී පියරතන හිමි සිදු කළ බද්දේගම ශ්‍රී පියරතන සංස්කරණය ද, දෙහිගස්පේ පඤ්ඤාසාර හිමි සිදු කළ දෙහිගස්පේ පඤ්ඤාසාර සංස්කරණය ද මෙහි දී වැදැගත් ය. මොරොන්තුඩුවේ සිරි ඤාණිස්සර ධම්මානන්ද හිමි ද පාලි ත්‍රිපිටක පරිවර්තනය හා සංස්කරණය කර මුද්‍රණය කිරීමේ වෑයමක නිරත වූ බව පෙනේ.[51] බෙන්තර සද්ධාතිස්ස හිමි ද පෙළ මුද්‍රණය කිරීමෙහි වෑයමක නිරත වූ අතර, අටුවා මුද්‍රණය කිරීමේ වෑයමක් ධර්මාරාම සංස්කරණය යටතේ සිදු වූවේ ය. එනමුත් මෙබඳු ප්‍රයත්නවලින් අපේක්ෂිත ප්‍රතිඵල පරිපූර්ණ ලෙස මුදුන් පත්

කරගත් බවක් නො පෙනේ. මීට අමතර ව පාලි මූල ග්‍රන්ථ මුද්‍රණය කිරීමේ වෑයම් රැසක් ලක් දිව පුරා සිදු වූයේ ථෙරවාද සම්ප්‍රදායය බලගැන්වීමට අවශ්‍ය පිටුබලය ලබා දෙමිනි.

## නිගමනය

මූල ග්‍රන්ථ පදනම් කරගත් බෞද්ධ පාලි සාහිත්‍යය වර්ධනය කිරීමට ලක් දිව දී සිදු වූයේ අතිවිශාල සේවයකි.[52] ත්‍රිපිටකය ඇතුළු පාලි මූල ග්‍රන්ථ වාචෝද්ග්‍රහණයෙන් පවත්වා ගෙන යෑම මාතලේ අලුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කිරීම, පාලි අට්ඨකථා සම්පාදනය, ටීකා, ගැටපද, සන්න ආදි පරිවාර සාහිත්‍ය වර්ධනය කිරීම හා අඛණ්ඩ ව පවත්වා ගෙන යෑම ආදි ක්‍රියා සන්තතිය හා තදනුබද්ධ වෙමින් ථෙරවාද සම්ප්‍රදායය බලගැන්වීමෙහි ලා 19 වැනි සිය වසේ සිට පාලි මූල ග්‍රන්ථ පරිවර්තනය හා සංස්කරණ ක්‍රියාවලියට ද ලාංකික ගිහි පැවිදි ධර්මධර, බහුශ්‍රැත, ශාසන ළැදි පිරිස් මූලිකත්වය ගනිමින් සම්බන්ධ වූයේ යුගයේ ධර්ම පිපාසිතයන්ගේ ධර්ම අවශ්‍යතා සපුරාලමිනි. ඒ අනුව 19 වැනි ශත වර්ෂය ආරම්භයේ දී හේවාවිතාරණ භාරය සිදු කළ පාලි මූල ග්‍රන්ථයෙන් සිදු වූ මෙහෙය අතිවිශාල ය. එමෙන් ම බුද්ධ ජයන්තිය නිමිත්තෙන් පාලි ත්‍රිපිටකය සංස්කරණය කිරීම හා එය නූතනය දක්වා ක්‍රියාවට නැංවීමෙන් ශ්‍රී ලංකාවේ ථෙරවාද බුදු දහම පිළිබඳ ධර්ම ප්‍රචිචය දියුණු විය. ආචාර්ය ඒ.පී. ද සොයිසා මහතා සරල සිංහල බසින් සිදු කළ ත්‍රිපිටක හා අටුවා පරිවර්තනය බුද්ධ භාෂිතය සාමාන්‍ය ජනයාට පවා ළං වීමට හේතු විය. 1980-1990 දශකවල ත්‍රිපිටකය සරල බසින් මුද්‍රණය වීම හේතු කොටගෙන සොයිසා මහතා සිදු කළ ශාසනික ක්‍රියාකාරිත්වය අඛණ්ඩවත් විය. කොතෙකුත් දුර්වලතා පැවැතිය ද පාලි අටුවා ටීකා ආදි ත්‍රිපිටකය උදෙසා රචිත මූල ග්‍රන්ථ සිංහල භාෂාවෙන් රචනා වීම නිසා පැරැණි දුර්ලභ ග්‍රන්ථ තවදුරටත් ආරක්ෂා වූ අතර ඒවායේ අන්තර්ගත ධර්ම ඥානය සියලු ලාංකික බෞද්ධ ජනයා වෙත විහිදී යෑමට ඉවහල් විය. ඉංග්‍රීසී බසින් රචිත එංගලන්ත පාලි සාහිත්‍ය සංගමයේ (Pali Text Socity) ත්‍රිපිටක හා අටුවා මුද්‍රණ කෙරේ සඳහනක් නො කළ ද ලක් දිව විද්වත් පිරිස් අතර එය ද බහුල වශයෙන් පරිශීලනය වන්නකි.

මූල ග්‍රන්ථ පිළිබඳ පෘථුල හා විදග්ධ උරුමකරුවන් වූ ලක් දිව වැසි ගිහි පැවිදි සියලු දෙනා අනාදිමත් කලක සිට අප්‍රතිහත ධෛර්යයෙන් රැකගත් මේ ධර්ම සාහිත්‍යය අද වන විටත් නො නැසී පවතී. ඒ අන් කිසිවක් නිසා නො ව, ථෙරවාද සම්ප්‍රදායය බලගැන්වීමෙහි ලා පාලි මූල ග්‍රන්ථ සංස්කරණය හා පරිවර්තන ක්‍රියාවලිය අඛණ්ඩ ලෙස පවත්වා ගෙන යෑම සුවිශේෂ සාධකයක් ලෙස ගිහි පැවිදි ධර්මධර, බහුශ්‍රැත, ශාසන ළැදි භික්ෂූන් වහන්සේලා හා ගිහියන් ඒකමතික ව විශ්වාස කළ හෙයිනි.

## ආන්තික සටහන්

1 මහාවංශය (සිංහල) පරි 5ඃ ගාථා 211-214, පරි 12 ඃ ගාථා 7-8, 13 වැනි පරිච්ඡේදය, ගාථා 1-21, 14 පරිඃ ගාථා 65, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2004, පි. 26, පි 50, පි. 53-51, පි 58.

2 මහාවංශය (සිංහල) පරි 12 ඃ ගාථා 1-8, එම, පි 50.

3 සුමංගල විලාසිනි දීඝනිකාය අටුවාව I, හේවාවිතාරණ මුද්‍රණය, 1918, පි. 1. ''සීහලදීපං පන අභතාථ වසීනා මහා මහින්දේන ඨපිත සිහලභාසාය දීපවාසිනමත්ථාය''

4 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ., පාලි සාහිත්‍යය, ආනන්ද පොත් සමාගම, අම්බලංගොඩ, 1960, පි. 18.

5 අංගුත්තරනිකාය II, තික නිපාතය, හරහණ්ඩු වග්ගය, පටිච්ඡන්න සූත්‍රය, හේවාවිතාරණ මුද්‍රණය, 2002, පි. 896.
''තථාගතස්සවේදිතො ධම්ම විනයො භික්ඛවේ විවටො විරොචති නො පටිච්ඡන්නො"

6 අබේනායක, ඔලිවර්., පාලි ත්‍රිපිටකය පෝෂණය කිරීම විෂයයෙහි ශ්‍රී ලාංකික දායකත්වය, 2300 වසරක මිහිඳු සංස්කෘතිය, 2300 අනුබුදු මිහිඳු ජයන්තිය වෙනුවෙන් බුද්ධ ශාසන අමාත්‍යාංශය ප්‍රකාශයට පත් කළ ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය, සංස්ඃ වජිර හිමි, කඹුරුගමුවේ., වීරරත්න. ඩබ්. ජී., නානායක්කාර, සනත්., බුද්ධ ශාසන අමාත්‍යාංශය, 1992, පි. 114

7 අධිකාරම්, ඊ. ඩබ්., පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, ජේ. කේ. ජී. ජයවර්ධන සහ සමාගම, කොළඹ, 1963, පි. 187.

8 වන්නිගේ, යසපාල., පාලි ත්‍රිපිටක සාහිත්‍ය හා ලක්දිව පාලි සාහිත්‍ය, ධාරා, චතුර් මාසික සාහිත්‍ය සංග්‍රහය, සංස් ඃ ගුණතිලක, විමල්., ඕපාත, ඩී.පියදාස., විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, කැලණිය1963, 2 කාණ්ඩය, 1 කලාපය, පි. 99.

9 මහාවග්ග පාලි 1, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ශ්‍රී ලංකා රජය, 1957, සංඥාපනය.

10 " " එම.

11 රාහුල හිමි, වල්පොළ., ලක්දිව බුදු සමයේ ඉතිහාසය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2009, පි 300. / සිල්වා, ද. සී. එම්. ඔස්ටින්., පැරණි ලංකාවේ ග්‍රන්ථ නිෂ්පාදනය, ලංකාවේ අධ්‍යාපනය, සියවස ප්‍රකාශනය, සංස්ඃ යූ. ඩී. ඇම්. සිරිසේන., අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල, 1995, පි. 217.

12 ජයවර්ධන, සෝමපාල., පාලි ටීකා සාහිත්‍යය, මෙත් සිසිල, බලංගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නාහිමි, ශතවර්ෂ පූර්ති කලාපය, 1896 - 1996, සංස්ඃ නන්ද හිමි, මිගහපැලැස්ස., සංස්ඃ ප්‍රකාශනයකි, 1996, පි. 72.

13 කුලසූරිය, ආනන්ද., සන්න ගැටපද ආදී ව්‍යාඛ්‍යාන ග්‍රන්ථවල ඇති සාහිත්‍යික වටිනාකම, ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්ඃ සුමනජෝති හිමි, අඹන්වැල්ලේ., සුමනසේකර, ඇන්. පී. ඇස්., ප්‍රාචීන භාෂෝපකාර සමාගම, කොළඹ, 1966, පි. 85-87.

14 පරණවිතාන, සෙනරත්., මහාවිහාරය සහ වෙනත් පැරණි විද්‍යාපීඨ, ලංකාවේ අධ්‍යාපනය, සියවස ප්‍රකාශනය, එම, පි. 53.

15 සිල්වා, ද. සී. එම්. ඔස්ටින්., පැරණි ලංකාවේ ග්‍රන්ථ නිෂ්පාදනය, ලංකාවේ අධ්‍යාපනය, සියවස ප්‍රකාශනය, එම, පි. 222.

''එම පුස්කොළ පොතෙහි ක්‍රි. ව. 1236-1271 දක්වා දඹදෙණිය පාලනය කළ II පරාක්‍රමබාහු රජුගේ රාජකීය මුද්‍රාව හඟවන සිංහල 'ශ්‍රී' අක්ෂරය ග්‍රන්ථාවසානයේ එන කර්තෘ නාම පාඨයෙහි සඳහන්ව තිබේ.''

16 " " එම, පි. 222.

17 " " එම, පි. 222.

18 '" " එම, පි. 222.

19 (සංස්) සෝමානන්ද හිමි, තෙරිපැහැ., සෝමාවති හේවාවිතාරණ මැතිණිය, ප්‍රකාශක, පී. ජී. පියදාස., 1977, පි. 3.

20 මලලසේකර, ගුණපාල., ලංකා පාලි සාහිත්‍යය, සී/ස ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1965, පි. 238 - 239.

21 " " එම, පි. 240.

22 " " එම, පි. 240.

1913 11 17 වන දින මියගිය හේවාවිතාරණ මහතා තමාගෙන් පසු ව මේ මූල ග්‍රන්ථ සංස්කරණ හා මුද්‍රණ කටයුතු ඉදිරියට ගෙන යා යුතු බවට සිය අවසන් කැමති පත්‍රයේ සටහන් කර තිබුණේ ය.

''දැනට මුද්‍රණය වෙමින් පවතින අට්ඨකථාවන් ප්‍රකාශයට පත් කිරිමට අවශ්‍ය හැම මුදලක් ම ද මනා අන්දමින් සංස්කරණය කරන ලද ත්‍රිපිටක ග්‍රන්ථයන් සම්පාදනය කිරිමට අවශ්‍ය විය හැකි මුදල් සියල්ල ම ද මේ අන්තිම කැමති පත්‍රයෙන් පවරා දෙන්නෙමි.'' සෝමානන්ද හිමි,

23 තෙරිපැහැ., හේවාවිතාරණ මැතිණිය, එම, පි. 42.

හේවාවිතාරණ මහතාගේ මරණයෙන් දෙ මසකට පසු 1913 මාර්තු 16 කොල්ලුපිටියේ ග්ලැමිස් හවුස් නම් එතුමාගේ නිවසේ දී මේ ත්‍රිපිටක මුද්‍රණ සභාව පිහිටුවී ය.

24 " " එම, පි. 43.

25 පුග්ගලපඤ්ඤත්තිකරණය, හේවාවිතාරණ මුද්‍රණය, 2002, ප්‍රකාශක සටහන

26 දීඝනිකාය ටීකා, හේවාවිතාරණ මුද්‍රණය, 1967, සංඥාපනය

27 සෝමානන්ද හිමි, තෙරිපැහැ., හේවාවිතාරණ මැතිණිය, එම. පි. 50.

28 මහාවග්ගපාළි 1, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, එම, පි. LXIII.

''2500 වන බුද්ධ ජයන්තිය නිමිත්ත කොටගෙන ආගමික අභිවෘද්ධිය හා ජාතික ප්‍රබෝධය උදෙසා ලංකා බෞද්ධයන් විසින් ලංකා ආණ්ඩුවේ ආධාරයෙන් කළ යුතු යැයි සම්මත වූ කටයුතු අතුරෙන් ත්‍රිපිටක පාලිය සිංහල භාෂාවට පරිවර්තනය කොට පෙළත් සමඟ මුද්‍රණය කිරීමේ ප්‍රධාන කාර්යය වශයෙන් සැලකිය යුතු බව එකල ලක් රජයේ ස්වදේශ කාර්යය භාර අමාත්‍යවරයා වූ අබේරත්න රත්නායක මහතා විසින් ආණ්ඩුවට දක්වන ලදි.''

29 '' '' එම, පි. LXII.

මේ අනුකාරක සභාවේ සාමාජිකයන් වූයේ එවක ආණ්ඩුවේ ස්වදේශ කටයුතු අමාත්‍ය ඒ. රත්නායක, කෘෂිකර්ම හා ආහාර පිළිබඳ අමාත්‍ය ජේ. ආර්. ජයවර්ධන, අධ්‍යාපන අමාත්‍ය ඇම්. ඩී. බණ්ඩා, පළාත් පාලන අමාත්‍යය පී. ඇෆ්. ගුණරත්න, ආචාර්ය ආනන්ද ඩබ්. පී. ගුරුගේ මහත්වරු ය.

30 '' '' එම, පි. LXIII.

31 '' '' එම, පි LXVII

32 '' '' එම, පි LXVIII

1955 ජූලි මස 10 වැනි දින කටයුතු ආරම්භ කළ ත්‍රිපිටක පරිවර්තන සංස්කාරක මණ්ඩලය ද ගිහි පැවිදි උගත් බහුශ්‍රැත පිරිසකගෙන් සැදුම් ලද්දක් විය.

33 මහාවග්ගපාළි 1, එම. පි. LXVIII, පට්ඨානප්පකරණ III, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජය මඟින් ප්‍රකාශිත යි, 1989, පි. XVII.

මේ ත්‍රිපිටක පරිවර්තන හා සංස්කරණ ක්‍රියාදාමය තුළ මුද්‍රණය වූ පළමු ග්‍රන්ථය වූයේ මහාවග්ගපාළිය යි. එය මුද්‍රණය වූයේ 1957 දී ය. එතැන් පටන් සමස්ත ත්‍රිපිටක ග්‍රන්ථ 52න් අවසාන ග්‍රන්ථය වූ අභිධර්ම පිටකයේ පට්ඨානප්පකරණයට අයත් කොටස් තුන ම 1989 දී මුද්‍රණය විය.

34 දෙහිවල නැදිමාලේ පිහිටි බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මඟින් බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, පුනර් මුද්‍රණය වූයේ, 2005 වසරේ දී ය. ඒ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂක කිරම විමලජෝති හිමිගේ මූලිකත්වයෙනි.

35 2006 වසරේ දී ප්‍රකාශයට පත් වන මේ ත්‍රිපිටක පුනර් මුද්‍රණ ග්‍රන්ථ මාලාව සඳහා දායකත්වය සපයන්නේ තායිවානයේ ආධාර ඇති ව බෝදාගම චන්දිම හිමි ය.

36 දීඝනිකාය 1, ඒ. පී. ද. සොයිසා මහතාගේ සිංහල පරිවර්තනය, ධර්ම සමය යන්ත්‍රාලය, කොළඹ, 1958, සංඥාපනය

37 පාලි භාෂාව හා සාහිත්‍ය පිළිබඳ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධි මට්ටමින් පෘථුල දැනුමක් ලත් අධිනීතිඥ ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා ථෙරවාද බුදු දහම ලක්දිව තව දුරටත් ප්‍රචාරය කිරීමට ථෙරවාද මූල ග්‍රන්ථ සරල සිංහලෙන් රචනා කිරීම උපස්තම්භක වන බව කල්පනා කළ බව පෙනේ.

38 දීඝනිකාය අටුවාව 2, ඒ. පී. ද සොයිසා මහතාගේ සිංහල පරිවර්තනය, එම, 1961, සංඥාපනය

39 දීඝනිකාය 1, ඒ. පී. ද සොයිසා මහතාගේ පරිවර්තනය, සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2012, පෙරවදන

40 දීඝනිකාය අටුවාව 2, ඒ. පී. ද සොයිසා මහතාගේ සංහල පරිවර්තනය, ධර්ම සමය යන්ත්‍රාලය, කොළඹ, 1961, සංඥාපනය

41 1960 දශකය අවසානය වන විට සොයිසා මහතාගේ අටුවාවේ සරල සිංහල පරිවර්තන ක්‍රියාවලිය ද සාර්ථක ව අවසන් වෙමින් පැවතිණ.

42 සිංහල දීඝනිකාය 1, සිංහල සූත්‍ර පිටක ග්‍රන්ථ මාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2009, පෙරවදන

43 " " එම, පෙරවදන

44 මජ්ඣිමනිකාය 1, මහමෙව්නාවේ බෝධිඥාන ත්‍රිපිටක ග්‍රන්ථමාලා, බෝධි ඥාන සභාව, පොල්ගහවෙල, 2003, පෙරවදන

45 සමන්තපාසාදිකා විනයට්ඨකථා සිංහල පරිවර්තනය I, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2009, පූර්විකාව

46 " " එම, පූර්විකාව

47 " " එම, පූර්විකාව

48 අංගුත්තරනිකාය 1, බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ මාලා, කොටහේන, 1948

49 කථාවත්ථුප්පකරණය, සිරිපාද ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, 1953, විඥප්ත්‍යාපනය

50 පට්ඨානප්පකරණය 1, හේවාවිතාරණ මුද්‍රණය, 1999, පෙරවදන

51 විමානවත්ථු, පේතවත්ථු, ථෙරගාථා, ථේරිගාථාපාළි, මොරොන්තුඩුවේ සිරි ඥාණිස්සර ධම්මානන්ද සංස්කරණය, 1930, සංඥාපනය

52 විමලවශ හිමි, බද්දේගම., බෞද්ධ සාහිත්‍යය, ප්‍රකාශක : ඩී ජේ රත්නායක අප්පුහාමි, කොළඹ 10, 1969, පි. 78.

## මූලාශ්‍රය නාමාවලිය
## ප්‍රාථමික මූලාශ්‍රය

**අංගුත්තරනිකාය** 1. (1948) බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ මාලා. කොටහේන.

**අංගුත්තරනිකාය** 11. (2002) හේවාවිතාරණ මුද්‍රණය.

**කථාවත්ථුප්පකරණය.** (1953) සිරිපාද ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව.

**දීඝනිකාය අටුවාව** 11. (1961) ඒ.පී. ද සොයිසා මහතාගේ සිංහල පරිවර්තනය. කොළඹ: ධර්ම සමය යන්ත්‍රාලය.

**දීඝනිකාය** 1. (1958) ඒ.පී. ද සොයිසා මහතාගේ සිංහල පරිවර්තනය. කොළඹ: ධර්ම සමය යන්ත්‍රාලය.

**දීඝනිකාය** 1. (2012) ඒ. පී. ද සොයිසා මහතාගේ පරිවර්තනය, කොළඹ 10: සී/ස. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

**දීඝනිකාය ටීකා.** (1967) හේවාවිතාරණ මුද්‍රණය.

**සිංහල දීඝනිකාය** 1. (2009) සිංහල සූත්‍ර පිටක ග්‍රන්ථ මාලා. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**පට්ඨානප්පකරණය** 1. (1999)හේවාවිතාරණ මුද්‍රණය.

**පට්ඨානප්පකරණ** 111. (1989) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජය මඟින් ප්‍රකාශිත යි.

**පුග්ගලපඤ්ඤත්තිකරණය.** (2002) හේවාවිතාරණ මුද්‍රණය.

**මහාවග්ගපාලි** 1. (1957) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. ශ්‍රී ලංකා රජය.

**මහාවංශය.** (සිංහල) (2004) දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**විමානවත්ථු, පේතවත්ථු, ථෙරගාථා, ථේරිගාථාපාළි.** (1930) මොරොන්තුඩුවේ සිරි ඤාණිස්සර ධම්මානන්ද සංස්කරණය.

**සුමංගල විලාසිනි දීඝනිකාය අටුවාව** 1. (1918) හේවාවිතාරණ මුද්‍රණය.

**මජ්ඣිමනිකාය** 1. (2003) මහමෙව්නාවේ බෝධිඥාන ත්‍රිපිටක ග්‍රන්ථමාලා. පොල්ගහවෙල: බෝධි ඥාන සභාව.

**සමන්තපාසාදිකා විනයට්ඨකථා සිංහල පරිවර්තනය** I. (2009) දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

## ද්විතීයික මූලාශ්‍රය
## ශාස්ත්‍රිය ග්‍රන්ථ

අධිකාරම්, ඊ. ඩබ්. (1963) **පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය.** කොළඹ: ජේ.කේ.ජී. ජයවර්ධන සහ සමාගම.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (1960) **පාලි සාහිත්‍යය.** අම්බලංගොඩ: ආනන්ද පොත් සමාගම.

මලලසේකර, ගුණපාල. (1965) **ලංකා පාලි සාහිත්‍යය.** කොළඹ: සී/ස ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

රාහුල හිමි, වල්පොළ. (2009) **ලක්දිව බුදු සමයේ ඉතිහාසය.** කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විමලවශ හිමි, බද්දේගම. (1969) **බෞද්ධ සාහිත්‍යය.** කොළඹ 10: ඩී.ජේ. රත්නායක අප්පුහාමි.

## ශාස්ත්‍රීය ලිපි


අබේනායක, ඔලිවර්., පාලි ත්‍රිපිටකය පෝෂණය කිරීම විෂයෙහි ශ්‍රී ලාංකික දායකත්වය, **2300 වසරක මිහිඳු සංස්කෘතිය, 2300 අනුබුදු මිහිඳු ජයන්තිය වෙනුවෙන් බුද්ධ ශාසන අමාත්‍යාංශය ප්‍රකාශයට පත් කළ ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය**, සංස්: වජිර හිමි, කඹුරුගමුවේ., වීරරත්න, ඩබ්. ජී., නානායක්කාර, සනත්., බුද්ධ ශාසන අමාත්‍යාංශය, 1992

කුලසූරිය, ආනන්ද., සන්න ගැටපද ආදි ව්‍යාඛ්‍යාන ග්‍රන්ථවල ඇති සාහිත්‍යික වටිනාකම, **ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ශාස්ත්‍රීය සංග්‍රහය**, සංස්: සුමනජෝති හිමි, අඹන්වැල්ලේ., සුමනසේකර, ඇන්. පී. ඇස්., ප්‍රාචීන භාෂෝපකාර සමාගම, කොළඹ, 1966

ජයවර්ධන, සෝමපාල., පාලි ටීකා සාහිත්‍යය, **මෙත් සිසිල, බලංගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නාහිමි ශතවර්ෂ පූර්ති කලාපය, 1896 - 1996**, සංස්: නන්ද හිමි, මිගහපැලැස්ස., සංස්: ප්‍රකාශනයකි, 1996

වන්නිගේ, යසපාල., පාලි ත්‍රිපිටක සාහිත්‍ය, **ධාරා චතුර් මාසික සංග්‍රහය**, සංස් : ගුණතිලක විමල්, ඕපාත., ඩී. පියදාස, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, කැලණිය, 1963, 2 කාණ්ඩය, 1 කලාපය

සිල්වා, ද සී. එම්. ඔස්ටින්., පැරණි ලංකාවේ ග්‍රන්ථ නිෂ්පාදනය, **ලංකාවේ අධ්‍යාපන සියවස ප්‍රකාශනය**, සංස්: යූ. ඩී. ඇම්. සිරිසේන, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල, 1995